ih, yulu wejrK
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

10 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 වේදිකා නාට්‍යයක සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,

(1) කතාන්දරය (2) සජීවීබවය (3) රූපණය ය (4) උපදේශනය ය

02 නාට්‍ය මුද්‍රා නාට්‍ය වලින් වෙනස් වන්නේ,

(1) වාචික අභිනය භාවිතයයි. (2) සංගීතය භාවිතයයි.

(3) කථාවක් ඉදිරිපත් කිරීමයි. (4) සජීවී වීමයි.

03 වර්තමානයේ බහුලව භාවිතා වන වේදිකාව වන්නේ,

(1) ග්ලොබ් රඟහලයි. (2) එළිමහන් වේදිකාවයි.

(3) ප්‍රොසීනියම් වේදිකාවයි. (4) කැරකෙන වේදිකාවයි.

04 ඉහත වේදිකාව භූගෝලීය වශයෙන් බෙදෙන කොටස් ගණන,

(1) 2 කි. (2) 3 කි. (3) 6 කි. (4) 9 කි.

05 අංගරචනයේ දී (පවුඩර් පෆ්) Powder Puff භාවිතයෙන් ඇති ප්‍රයෝජනය වන්නේ,

(1) මුහුණේ හැඩතල මතුකර ගැනීමය. (2) පැහැදිලිව මුහුණේ වර්ණ ගැන්වීමය.

(3) දහදිය දැමීම වළක්වා ගැනීමය. (4) මේකප් ඉවත් කිරීමය.

06 සංගීතය හා නර්තනය බහුලව දක්නට ලැබෙන්නේ,

(1) අසම්මත නාට්‍යවලය. (2) ලෝක ධර්මී නාට්‍යයේ ය.

(3) නාට්‍ය ධර්මී නාට්‍යයේ ය. (4) ග්‍රීක නාට්‍යයේ ය.

07 සමාරෝපය බෙදා දක්වන කොටස් ගණන,

(1) 2 (2) 4 (3) 3 (4) 5

08 නාට්‍යයක ගැටුමෙහි අරමුණු නොවන්නේ,

(1) නාට්‍යයේ රසය තීව්‍ර කිරීම. (2) ප්‍රේක්ෂක කුතුහලය වර්ධනය.

(3) ප්‍රේක්ෂකයා නොමඟ යැවීම. (4) ප්‍රේක්ෂක අවධානය රඳවාගැනීම.

09 කතාන්දරයක ලක්ෂණයකි

(1) කාලය සීමාවීම. (2) නරඹා රසවිඳිය හැකිය.

(3) කේවල රසවිඳීමයි. (4) සාමූහිකව රසවිඳිය හැකිය.

10 සිංහබාහු නාට්‍ය රචනා වී ඇත්තේ,

(1) ජාතක කථාවක් ඇසුරෙනි. (2) ජන කථාවකිනි.

(3) සුරංගනා කථාවකිනි. (4) වංශ කථාවකිනි.

11 නාට්‍ය ධර්මී ශෛලියට අයත් නාට්‍යයකි

(1) කැලණි පාලම (2) නරිබෑණා (3) සකුන්තලා (4) හුණුවටය

12 ''සේරිවාණිජ'' ජාතක කථාව ඇසුරෙන් නිර්මාණය කරන ලද නාට්‍යය

(1) මහාසාර (2) කදාවළලු (3) මනමේ (4) හව කඩතුරාව

13 සෝලියස් මැන්දිස්

(1) චිත්‍ර ශිල්පියෙකි. (2) නර්තන ශිල්පියෙකි.

(3) මුද්‍රා නාට්‍ය ශිල්පියෙකි.(4) නාට්‍ය ශිල්පියෙකි.

14 ''නෘත්‍ය'' රංග යනු

(1) භාව ප්‍රකාශනයෙන් තොර නර්තනයකි.

(2) භාව ප්‍රකාශන නර්තනයයි.

(3) නාට්‍යය නිර්මාණයකට නර්තනයයි.

(4) මුද්‍රා නාට්‍යයයි.

15 නිවැරදිව දෙබස් උච්චාරණය සඳහා නළුවෙකු ප්‍රගුණ කළයුතු අභ්‍යාස වන්නේ,

(1) චිත්ත ඒකාග්‍රතා අභ්‍යාසයි. (2) ශ්වසන අභ්‍යාසයි.

(3) නම්‍යශීලී අභ්‍යාසයි. (4) කාපන අභ්‍යාසයි.

16 ''නාට්‍යෝපකරණ'' යනු

(1) නළුවන්ගේ වේෂභූෂණයි. (2) පසුතල නිර්මාණයි.

(3) ආලෝක පහන්ය. (4) නළුවන් භාවිතා කරන විවිධ භාණ්ඩය.

17 ලෝක ධර්මී ශෛලියේ නාට්‍යයන් හි දැකිය නොහැකිය

(1) පසුතල නිර්මාණ (2) පොතේ ගුරා සිටීම

(3) ව්‍යවහාරික සංවාද (4) සංගීතය යොදාගැනීම

18 සුඛ දුක්ඛ ආදී ලෝක ස්වභාවය අභිනය මගින් ප්‍රකාශ කිරීම

(1) නෘත්ත යි. (2) නාට්‍යය යි. (3) අභිනය යි. (4) නෘත්‍ය යි.

19 සදාකාලික මනුෂ්‍ය ගතිපැවතුම් මතුකර දැක්වීම සඳහා මාහාචාර්ය සරච්චන්ද්‍රයන් 1961 නිර්මානය කරන ලද නාට්‍ය

(1) මනමේ (2) සිංහබාහු (3) මහාසාර (4) රත්තරං

20 වේදිකා නාට්‍යයකට නැතිවම බැරි පුද්ගලයන් වන්නේ,

(1) පෙළරචක හා අධ්‍යක්ෂක (2) අධ්‍යක්ෂක හා අර්ථපති

(3) නළුවා හා ප්‍රේක්ෂකයා (4) අංගරචනා හා වේෂභූෂණ ශිල්පියා

● පහත කවි, සංවාද ඇසුරෙන් අංක 21 සිට 25 දක්වා පිළිතුරු සපයන්න.

A රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට
විදුරු තරු දෙනා මෙන් නෙත් රැවිය මට

B උඩින් උඩින් උඩු ගුවනින් ගෙනාවා
බිමින් බිමින් බිම් තැන්නෙන් ගෙනාවා

C වඩිග පුර දේසෙන් - සක්දෙන බමුණු ඇවිදින්

D අත්තක පිපි මලක් ලෙසේ, පෙත්තක ඇඳි ඉරක් ලෙසේ

E අසාලා කීවේ වගතුග සියල්ලක්
යොදාලා ගන්න බොරු බස් ඇසිල්ලක්

21 සන්නියකුන් යාගයට අයත් පද්‍ය වන්නේ,

(1) B (2) A (3) C (4) D

22 E අක්ෂරයෙන් දක්වෙන්නේ,

(1) කොහොඹා කංකාරියේ පද්‍යයකි. (2) වඩිග පටුනේ පද්‍යයකි.

(3) රටයකුමේ පද්‍යයකි. (4) සන්නියකුම් යාගයේ පද්‍යයකි.

23 වඩිග පටුන නම් නර්තනාංගය අයත්වනුයේ,

(1) A (2) B (3) C (4) D

24 B අක්ෂරයෙන් කියැවෙන්නේ,

(1) කොහොඹා කංකාරිය (2) දහඅට සන්නිය

(3) වඩිගපටුන (4) රටයකුම

25 උඩරට පළාතට අයත් යක්කම් 5 සමග බද්ද වී ඇත.

(1) D (2) C (3) E (4) B

26 අංගරචනයේ දී මුහුණ මූලික වශයෙන් බෙදා දක්වන කොටස් ගණන,

(1) හතකි. (2) හයකි. (3) පහකි. (4) හතරකි.

27 දර්පණ අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් නළුවාට

(1) සංවාද උච්චාරණය පහසුවෙයි. (2) වේෂභූෂණ සඳහා උපකාරී වේ.

(3) නම්‍යශීලීත්වය ඇතිවේ. (4) දෑස් සබඳතාවය පවත්වාගත හැකිය.

28 ප්‍රාසාංගික කලා පමණක් අන්තර්ගත වරණය වන්නේ,

(1) සංගීතය, ඔපෙරා, මූර්ති (2) නර්තනය, සිනමාව, නාට්‍යය

(3) නර්තනය, සංගීතය, ඔපෙරාව (4) ඔපෙරා, චිත්‍ර, සිනමාව

29 ''අවස්ථානුකෘතිර් නාට්‍යම්'' යන ප්‍රකාශය කරන ලද්දේ,

(1) ධනංජය පඬිවරයාය (2) භරතමුනිය

(3) විශ්වනාථය (4) ඇරිස්ටෝටල්ය

30 මහ මඟ අසල එක් තැනක පිරිසක් විසින් කරනු ලබන නාට්‍ය වන්නේ,

(1) සංස්කෘත නාට්‍යයයි. (2) වීථි නාට්‍යයයි.

(3) මුද්‍රා නාට්‍යයයි. (4) ළමා නාට්‍යයයි.

31 කාලගෝල නාට්‍යයේ නිර්මාණකරුවා වන්නේ,

(1) එදිරිවීර සරච්චන්ද්‍රයන් ය. (2) හෙන්රි ජයසේන ය.

(3) පුන්‍යසේන ගුණසිංහ ය. (4) ජයලත් මනෝරත්න ය.

32 ''මානෙල් ජයසේන'' රඟපෑ නාට්‍යයකි

(1) හුණුවටය (2) මනමේ (3) කපුවා කපෝති (4) මඟුල් ප්‍රස්තාව

33 ''කුවේණි'' නාට්‍යයේ නිර්මාණකරු වන්නේ,

(1) බන්දුල ජයවර්ධන (2) පරාක්‍රම නිරිඇල්ල

(3) හෙන්රි ජයසේන (4) සුගතපාල ද සිල්වා

- පහත ඡායාරූප ඇසුරෙන් අංක 34 - 39 දක්වා වූ ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



A B C D E F

34 ශ්‍රී ලංකාවේ ප්‍රකට නර්තන ශිල්පීන් දැක්වෙන ඡායාරූප වන්නේ,

(1) B E (2) A C (3) D F (4) C D

35 තොප්පි වෙළෙන්දා, හිම කුමාරි නාට්‍ය නිර්මාණකරුගේ අක්ෂරය

(1) A (2) B (3) C (4) D

36 ජෝර්ජ් කීට් දැක්වෙන අක්ෂරය වන්නේ,

(1) A (2) B (3) C (4) D

37 වාර්තා රංග ශෛලිය භාවිතා කළ නාට්‍ය ශිල්පියෙකි

(1) C (2) D (3) E (4) F

38 ''කරදිය'' මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද ශිල්පියා දැක්වෙන්නේ,

(1) A (2) B (3) C (4) D

39 F අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) නිත්තවෙල ගුණයා ය. (2) චිත්‍රසේන ය.

(3) පනීභාරත ය. (4) සෝලියස් මැන්දිස් ය.

40 ටවර්හෝල් රංග ශාලාවට ප්‍රධාන වූ නාට්‍ය විශේෂය

(1) නූර්ති (2) නාඩගම් (3) මුද්‍රා (4) වේදිකා නාට්‍ය

(1 x 40 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 (1) ''අභිනය'' යන්නෙහි අරුත පහදන්න. (ල. 02)

(2) සතර අභිනය නම්කොට පහදන්න. (ල. 04)

(3) රංගනයේ දී සතර අභිනය භාවිතා වන අයුරු පහදන්න. (ල. 06)

02 (1) ප්‍රධාන ශෛලීන් 2 නම් කරන්න. ( ල' 02)

(2) ලෝක ධර්මී ශෛලියේ ලක්ෂණ 5 ක් ලියන්න. ( ල . 05)

(3) නාට්‍ය ධර්මී ශෛලියේ ලක්ෂණ 5 ක් ලියන්න. ( ල . 05)

03 (1) උඩරට පළාතට අයත් ශාන්තිකර්මයක් නම් කරන්න. ( ල . 02)

(2) එහි අන්තර්ගත රංග අවස්ථාවක් විස්තර කරන්න. (ල. 04)

(3) ශාන්තිකර්මයක ලක්ෂණ මොනවා ද? (ල. 06)

04 (1) අංගරචනය අයත්වන අභිනය කුමක් ද? (ල. 02)

The National e-learning Portal for The General Education